එල්. ඩී. බී. 11/2008

**2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක**
**නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත**

2008 අංක 1 දරණ මාදක ඖෂධ සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනතේ 19 වන වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 31 වන වගන්තිය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාවේ (2)වන ඡේදය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලද නියෝග.

මහින්ද රාජපක්ෂ
ජනාධිපති

2010 . . . . . . . . මස . . . . . . . . දින,
කොළඹ දී ය.

**නියෝග**

1. මේ නියෝග 2010 අංක 1 දරණ "පුරෝගාමී රසායනික ද්‍රව්‍ය (නියාමන පියවර) නියෝග'' යනුවෙන් හඳුන්වනු ලබන අතර (මෙහි මින්මතු "බලාත්මක වන දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) . . . . . . . . . . . . . . . . . . . . . . දින සිට බලාත්මක විය යුතුය.

**I වන කොටස**
**බලපත්‍ර නිකුත් කිරීම**

2. (මෙහි මින්මතු "පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 2008 අංක 1 දරණ මාදන ඖෂධ සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනතේ පළමුවන උපලේඛණයේ I වන වගුවෙහි සහ II වන වගුවෙහි නිශ්චිතව සඳහන් කර ඇති ද්‍රව්‍ය කිසිවක් ආනයනය කිරීමට හෝ අපනයනය කිරීමට අදහස් කරන සෑම තැනැත්තෙකුම විසින් ඒ ව්‍යාපාරයට සම්බන්ධ වීමට මාස දෙකකට පෙරාතුව මෙහි "අ" උපලේඛණයේ දක්වා ඇති 1 වන ආකෘතියට අනුව ඉල්ලුම්පත්‍රයක් (මෙහි මින්මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) පුරෝගාමී පාලන අධිකාරිය වෙත තත්කාර්ය සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. අධිකාරියෙන් බලපත්‍රයක් ලබාගැනීම සඳහා වූ සෑම ඉල්ලුම්පත්‍රයක්ම මේ නියෝගවල "ආ" උපලේඛණයේ සඳහන් කර ඇති අදාල ගාස්තුව සමඟ ඉදිරිපත් කළ යුතුය.

4. (අ) අදාල ගාස්තුව සමඟ ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලුම්පත්‍රය ලැබීමෙන් පසු අධිකාරිය විසින් ඒ ඉල්ලුම්පත්‍රයේ සපයා ඇති තොරතුරුවල නිරවද්‍යාතාවය සහ ආනයනකරුවන් සහ අපනයනකරුවන් විසින් කාර්යයන් කරගෙන යන ආකාරය පිළිබඳව නිසැකව දැනගත යුතු අතර ඒ ඉල්ලුම්පත්‍රය ලැබුන දින සිට මසක් ඇතුලත බලපත්‍රය නිකුත් කළ යුතුය.

(ආ) නිකුත් කළ සෑම බලපත්‍රයක් ම ඒ බලපත්‍රය නිකුත් කළ දින සිට වසර එකක කාලයක් සඳහා වලංගු විය යුතුය.

(ඇ) ආනයනකරුවන් සහ අපනයනකරුවන් විසින් -

(i) ඉල්ලුම්පත්‍රයේ සපයන ලද තොරතුරුවල නිරවද්‍යාතාවය පිළිබඳ හෝ

(ii) ඒ කටයුතු කරගෙන යන ආකාරය පිළිබඳව

අධිකාරිය අතෘප්තියට පත්වූ අවස්ථාවක අධිකාරිය විසින් ඉල්ලුම්කරුට බලපත්‍රයක් නිකුත් නොකළ යුතුය.

එසේ වුවද, අධිකාරිය විසින් බලපත්‍රයක් සඳහා ඉල්ලුම්කල තැනැත්තකුට ඒ පිළිබඳව කරුණු දැක්වීමට අවස්ථාවක් සැපයිය යුතුය.

5. (අ) බලපත්‍රලාභී ආනයනකරුවකු හෝ අපනයනකරුවකු විසින් පනතේ පළමුවන උපලේඛණයේ I වන වගුවෙහි සහ II වන වගුවේ නිශ්චිතව සඳහන් කර ඇති බලපත්‍රයෙන් ආවරණය කරන ලද ද්‍රව්‍ය නොවන ද්‍රව්‍ය ආනයනය කිරීමට හෝ අපනයනය කිරීමට අරමුණු කරන අවස්ථාවකදී, ඔහු විසින් අලුත් ද්‍රව්‍ය පිළිබඳ කටයුතු කිරීමට කලින් මාසයකට නොඅඩු කාලසීමාවක් තුල මේ නියෝගවල "අ" උපලේඛණයේ දක්වා ඇති 2 වන ආකෘතියට අනුව ඉල්ලුම්පත්‍රයක් බලපත්‍රය සංශෝධනය කිරීම සඳහා අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතුය.

(ආ) සංශෝධනය කිරීම සඳහා වූ සෑම ඉල්ලුම්පත්‍රයක්ම මේ නියෝගවල "ආ" උපලේඛණයේ සඳහන් කර ඇති අදාල ගාස්තුවකින් සමන්විත විය යුතුය.

(ඇ) අදාල ගාස්තුව සමඟ සංශෝධනය කිරීම සඳහා වූ ඉල්ලුම්පත්‍රයක් ලැබීමෙන් පසුව අධිකාරිය විසින් ඒ ඉල්ලුම්පත්‍රයේ අඩංගු තොරතුරුවල නිරවද්‍යාතාවය පිළිබඳ නිසැකව දැනගත යුතු අතර ඉල්ලුම්පත්‍රය ලැබුන දින සිට සති දෙකක් ඇතුලත බලපත්‍රය සංශෝධනය කළ යුතුය.

6. (අ) ආනයනකරුවකුට හෝ අපනයනකරුවකුට නිකුත් කරනු ලැබූ සෑම බලපත්‍රයක්ම වාර්ෂිකව අලුත් කළ යුතුය. එවැනි සෑම ආනයනකරුවකු හෝ අපනයනකරුවකු විසින්ම බලපත්‍රය නිකුත් කරනු ලැබූ දින සිට හෝ එහි යම් අලුත් කිරීමක් කරනු ලැබූ දින සිට වසරක කාලයක් ඉකුත් වීමට මසකට පෙරාතුව මෙම නියෝගවල "අ" උපලේඛණයේ දක්වා ඇති 3 වන ආකෘතියට අනුව ඉල්ලුම්පත්‍රයක් තත්කාර්යය සඳහා අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතුය.

(ආ) බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වූ සෑම ඉල්ලුම්පත්‍රයක්ම මේ නියෝගවල "ආ" උපලේඛණයේ සඳහන් කරන ලද ගාස්තුවකින් සමන්විත විය යුතුය.

(ඇ) අදාල ගාස්තුව සමඟ අලුත් කිරීම සඳහා වූ ඉල්ලුම්පත්‍රයක් ලැබීමෙන් පසුව අධිකාරිය විසින්, ඉල්ලුම්පත්‍රයේ සපයන ලද තොරතුරුවල නිරවද්‍යතාවය නිසැකව දැනගත යුතු අතර ඉල්ලුම්පත්‍රය ලැබුන දින සිට සති දෙකක කාලයක් තුළ ඉදිරි වසරක කාලයක් සඳහා බලපත්‍රය අලුත් කළ යුතුය.

7. අධිකාරිය විසින් -

(i) පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ බලපත්‍රය නිකුත් කරන ලද්දේ යම් කොන්දේසිවලට යටත්වද, එකී යම් කොන්දේසියක් උල්ලංඝණය කරනු ලැබූ විටක නැතහොත් අධිකාරිය විසින් නිකුත් කරනු ලැබූ යම් විධානයකට අනුකූල වී නොමැති අවස්ථාවකදී හෝ

(ii) අධිකාරිය වෙත ඉදිරිපත් කළ යම් තොරතුරක් අසත්‍ය හෝ සාවද්‍ය වන හෝ අදාළ දත්ත කිසිවක් සඟවා ඇති අවස්ථාවක

බලපත්‍රය අවලංගු කළ හැකි වන්නේය.

එසේ වුවද, ඒ අවලංගු කිරීමට පෙරාතුව අධිකාරිය විසින් ඒ බලපත්‍රය නිකුත් කරනු ලැබූ තැනැත්තාට ඒ පිළිබඳව කරුණු දැක්වීමට අවස්ථාවක් ලබාදිය යුතුය.

8. මේ නියෝගයේ 7 වන නියෝගය යටතේ බලපත්‍රය අවලංගු කරනු ලැබූයේ යම් තැනැත්තෙකුගේද, බලපත්‍රය අවලංගු කිරීමේ දින සිට වසර දෙකක කාල සීමාවක් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණක් නම් අලුත් බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරිමට ඒ තැනැත්තාට සුදුසුකම් ලැබිය යුතුය.

## II වන කොටස
## පරිශ්‍ර ලියාපදිංචි කිරීම

9. පනතේ පළමුවන උපලේඛණයේ I වන වගුව සහ II වන වගුව තුළ නිශ්චිතව සඳහන් කර ඇති ද්‍රව්‍ය ආනයනය කිරීමට හෝ අපනයනය කිරීමට අදාළ වන කාර්යයන් කරගෙන යන්නා වූ පරිශ්‍රයන්, බලපත්‍රය නිකුත් කළ දින සිට මසක් ඇතුලත සෑම බලපත්‍රලාභියෙකු විසින්ම අධිකාරිය සමඟ ලියාපදිංචි කළ යුතුය.

10. 9 වන නියෝගයේ සඳහන් කරන ලද පරිශ්‍රයන් ලියාපදිංචි කිරීම සඳහා වූ සෑම ඉල්ලුම්පත්‍රයක්ම, බලපත්‍රය නිකුත් කළ දින සිට සති දෙකක කාලයක් තුළ මේ නියෝගවල "අ" උපලේඛණයේ දක්වා ඇති 4 වන ආකෘතියට අනුව අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

11. අධිකාරිය යටතේ පරිශ්‍රයන් ලියාපදිංචි කිරීම සඳහා වූ සෑම ඉල්ලුම්පත්‍රයක්ම මේ නියෝගවල "ආ" උපලේඛණයේ සඳහන් කරන ලද අදාළ ගාස්තුවලින් සමන්විත විය යුතුය.

12. (අ) අදාළ ගාස්තුව සමඟ ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රය ලැබීමෙන් පසුව අධිකාරිය විසින්, ඉල්ලුම්පත්‍රයේ සපයා ඇති තොරතුරුවල නිරවද්‍යතාවය පිළිබඳ සහ ආනයනකරුවන් සහ අපනයනකරුවන් විසින් කාර්යයන් කරගෙන යන්නා වූ ආකාරය පිළිබඳ නිසැකව දැනගත යුතු අතර ඉල්ලුම්පත්‍රය ලැබුන දින සිට සති දෙකක් ඇතුලත ඒ පරිශ්‍රය ලියාපදිංචි කළ යුතුය.

(ආ) අධිකාරිය විසින් -

(i) ආනයනකරු හෝ අපනයනකරු විසින් ඉල්ලුම්පත්‍රයේ සඳහන් කරන ලද තොරතුරුවල නිරවද්‍යතාවය පිළිබඳ හෝ

(ii) ඒ ආනයනකරු හෝ අපනයනකරු විසින් කරගෙන යන්නා වූ ආශ්‍රිත කාර්යයන් කෙරෙන ආකාරය පිළිබඳව,

සෑහීමට පත්නොවන අවස්ථාවකදී, අධිකාරිය විසින් කිසිදු පරිශ්‍රයක් ලියාපදිංචි නොකළ යුතුය.

එසේ වුවද, පරිශ්‍රයක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීමක් කරනු ලැබූ තැනැත්තකුට ඒ පිළිබඳව කරුණු දැක්වීමට අධිකාරිය විසින් අවස්ථාවක් ලබාදිය යුතුය.

## III කොටස
## අධීක්ෂණය සහ පරීක්ෂාව

13. අධිකාරියේ සාමාජිකයින් විසින් අවම වශයෙන් මාස තුනකට වරක්වත් බලපත්‍රලාභියාගේ ලියාපදිංචි කරනු ලැබූ පරිශ්‍රයට පැමිණ 1 වන උපලේඛණයේ I වන වගුවෙහි සහ II වන වගුවේ නිශ්චිතව සඳහන් කර ඇති ද්‍රව්‍ය භාවිත කරමින් කරගෙන යන්නා වූ ක්‍රියාකාරකම් පිළිබඳ අධීක්ෂණය කළ යුතු අතර නිශ්චිතව සඳහන් කර ඇති ද්‍රව්‍යයන් ගබඩා කර ඇති ආකාරය පිළිබඳව සහ අදාළ සියලු උපකරණ භාවිතය සහ බලපත්‍රලාභියා විසින් පවත්වාගෙන යනු ලබන පොත්, ලේඛණ, රෙජිස්ටර් සහ වාර්තා පිළිබඳවද පරීක්ෂා කළ යුතුය.

14. අධිකාරිය විසින් බලපත්‍රලාභියාගේ ක්‍රියාකාරකම් පිළිබඳ විමසා බැලිය යුතු අතර ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු ඉල්ලා සිටීම සහ අවශ්‍ය අවස්ථාවලදී ක්‍රියාකාරකම් පරීක්ෂා කිරීම කළ යුතුය.

## IV වන කොටස
## ත්‍රෛමාසික වාර්තා

15. මේ පනතේ පළමුවන උපලේඛණයේ I වන වගුවෙහි සහ II වන වගුවේ නිශ්චිතව සඳහන් කර ඇති යම් ද්‍රව්‍යයන් සෑම බලපත්‍රලාභී ආනයනකරුවකු හෝ අපනයනකරුවකු විසින්, මෙහි "අ" උපලේඛණයෙහි දක්වා ඇති 5 වන ආකෘතියට අනුව ඒ ද්‍රව්‍යය ආනයනය, අපනයනය, භාවිතය, නිෂ්පාදනය සහ බෙදා හැරීම පිළිබඳ පිළිඹිබු කෙරෙන ත්‍රෛමාසික වාර්තා අධිකාරිය වෙත භාරදිය යුතුය.

16. ඒ වාර්තාවල පළමුවැන්න බලපත්‍රය නිකුත් කල දින සිට මාස තුනක් ඇතුළත අධිකාරිය වෙත භාරදිය යුතුය.

17. බලපත්‍රලාභියා විසින් -

(අ) 15 වන නියෝගයේ සඳහන් කරන ලද ත්‍රෛමාසික වාර්තා භාරදීම පැහැර හැර ඇති බව, හෝ

(ආ) අධිකාරියට අසත්‍ය හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව, හෝ

(ඇ) අදාළ තොරතුරු ලබා දී නොමැති බව,

අධිකාරියට පෙනී යන අවස්ථාවකදී ඒ තැනැත්තාගේ බලපත්‍රය අවලංගු කිරීමට අධිකාරියට බලය තිබිය යුතුය.

## V වන කොටස

## බලපත්‍රලාභී ආනයනකරුවන්ගේ හා අපනයනකරුවන්ගේ කාර්යයන්

18. කිසිදු බලපත්‍රලාභී ආනයනකරුවකු විසින්, මේ පනතේ පළමුවන උප ලේඛණයේ I වන සහ II වන වගුවල නිශ්චිතව සඳහන් කර ඇති යම් ද්‍රව්‍යයක් ආනයනකරු සමඟ ලියාපදිංචි වී ඇති තැනැත්තෙකුට මිස කිසිදු තැනැත්තෙකුට ඉහත කී ද්‍රව්‍ය විකිණීම හෝ ලබාදීම නොකල යුතුය.

19. පනතේ පළමුවන උපලේඛණයේ I වන සහ II වන වගුවල නිශ්චිතව සඳහන් කර ඇති ද්‍රව්‍ය කිසිවක් ආනයනය කරන සෑම බලපත්‍රලාභී ආනයනකරුවකු විසින්ම, 18 වන නියෝගයේ කාර්යයන් සඳහා රෙජිස්ටරයක් පවත්වාගෙන යායුතු අතර එහි පහත දැක්වෙන තොරතුරු ඇතුලත් කළ යුතුය.

(අ) ආනයනකරුගෙන් ඉහත කී ද්‍රව්‍ය මිලටගත් හෝ ලබාගත් තැනැත්තන්ගේ නම්

(ආ) ද්‍රව්‍යවල නම්

(ඇ) විකුණන ලද, දෙන ලද හෝ ලබාගත් ප්‍රමාණය

(ඈ) මිලට ගත්, දෙන ලද, ලබාගත් ඉහත කී ද්‍රව්‍යවලින් වන කාර්යයන් පිළිබඳ තොරතුරු.

20. මේ පනතේ පළමුවන උපලේඛණයේ I වන වගුවෙහි සහ II වන වගුවේ නිශ්චිතව සඳහන් කර ඇති ද්‍රව්‍ය කිසිවක් ආනයනය කරන හෝ අපනයනය කරන සෑම බලපත්‍රලාභී ආනයනකරුවකු හෝ අපනයනකරුවකු විසින්ම අවසන් භාවිතා කරන්නන්ට සිල්ලරට විකිණීම හැර ගබඩා කිරීමේ සහ බැහැර කිරීමේ කාර්යයන් සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් නිෂ්කාශනයක් ලබාගත යුතුය.

21. සෑම බලපත්‍රලාභී ආනයනකරුවකු හෝ අපනයනකරුවකු විසින් පනතේ පළමුවන උපලේඛණයේ I වන හෝ II වන වගුවේ නිශ්චිතව සඳහන් කර ඇති ද්‍රව්‍ය 9 වන නියෝගයේ සඳහන් කරන ලද ලියාපදිංචි පරිශ්‍රවල ගබඩාකර ආරක්ෂා කරන බවට සහතික විය යුතු අතර ඉහත කී ද්‍රව්‍යවලට අදාළව කිසියම් සොරකමක්, විස්තර කල

නොහැකි පාඩුවක් හෝ සැක කටයුතු කාර්යයන් පිළිබඳ අධිකාරිය වෙත හෝ වෙනත් යම් සුදුසු අධිකාරියක් වෙත නොපමාව දැනුම් දිය යුතුය.

22. 18 වන, 19 වන, 20 වන සහ 21 වන නියෝග උල්ලංඝනය කරන බලපත්‍රලාභියෙකු සම්බන්ධයෙන් අධිකාරිය විසින් මෙම පනත යටතේ පනවන ලද වෙනත් නෛතික ප්‍රතිඵලයන්ට අමතරව ඒ තැනැත්තාගේ බලපත්‍රය අවලංගු කරනු ලැබිය යුතුය.

එසේ වුවද, ඒ අවලංගු කිරීමට පෙරාතුව ම අධිකාරිය විසින් එය නිකුත් කල තැනැත්තාට කරුණු දැක්වීමට අවස්ථාවක් ලබාදිය යුතුය.

## VI වන කොටස
## වෙළෙන්දන් සහ අවසන් භාවිත කරන්නන්

23. (අ) (මෙහි මින්මතු "වෙළෙන්දෙකු" යනුවෙන් සඳහන් කරනු ලබන) පනතේ පළමුවන උප ලේඛණයේ I වන සහ II වන වගුවල නිශ්චිතව සඳහන් කරන ලද යම් ද්‍රව්‍යයක් විකිණීමට අදහස් කරන, හෝ
(ආ) (මෙහි මින්මතු "අවසන් භාවිත කරන්නන්" යනුවෙන් සඳහන් කරනු ලබන) පනතේ පළමුවන උප ලේඛණයේ I වන සහ II වන වගුවල නිශ්චිතව සඳහන් කර ඇති යම් ද්‍රව්‍යයක් භාවිත කිරීමට අදහස් කරන,

සෑම තැනැත්තෙකුම, මෙහි "අ" උපලේඛණයේ පිළිවෙලින් දක්වා ඇති 6 සහ 9 යන ආකෘතිවලට අනුව මේ නියෝග බලාත්මක වන දින සිට මාස තුනක් ඇතුලත අධිකාරියට ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කල යුතුය.

24. අධිකාරියට ලියාපදිංචි වීම සඳහා ඉදිරිපත් කරන සෑම ඉල්ලුම්පත්‍රයක්ම මේ නියෝගවල "ආ" උපලේඛණයේ සඳහන් කර ඇති අදාල ගාස්තුවලින් සමන්විය යුතුය.

25. අදාල ගාස්තු සමඟ ඉල්ලුම්ත්‍රය ලැබුනු පසුව අධිකාරිය විසින් ඉල්ලුම්පත්‍රයේ සපයන ලද තොරතුරුවල නිරවද්‍යතාවය සහ අවස්ථාවෝචිත පරිදි වෙළෙන්දා හෝ අවසන් භාවිතා කරන්නා විසින් ක්‍රියාකාරකම් කරගෙන යනු ලබන ආකාරය පිළිබඳ නිසැකව දැනගත යුතු අතර ඒ ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කිරීමේ දින සිට ආරම්භ වන වසර එකක කාල සීමාවක් සඳහා ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කළ යුතුය.

26. වෙළෙන්දන් සහ අවසන් භාවිත කරන්නන් -

(අ) ඉල්ලුම්පත්‍රයේ දක්වන ලද තොරතුරුවල නිරවද්‍යතාවය පිළිබඳව, හෝ

(ආ) කරගෙන යනු ලබන ක්‍රියාකාරකම්වල ආකාරය පිළිබඳ,

සෑහිමකට පත්නොවන අවස්ථාවකදී අධිකාරිය විසින් ඒ ඉල්ලුම්කරු ලියාපදිංචි කිරීම නොකල යුතුය.

එසේ වුවද, අධිකාරිය විසින් ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කල තැනැත්තාට කරුණු දැක්වීමට අවස්ථාවක් ලබාදිය යුතුය.

27. (අ) පනතේ පළමුවන උපලේඛණයේ I වන වගුව සහ II වන වගුව තුල නිශ්චිතව දක්වා ඇති ලියාපදිංචි කිරීමෙන් ආවරණය කරන ලද ද්‍රව්‍ය නොවන ද්‍රව්‍ය වෙළඳාම් කිරීමට අදහස් කරන වෙළෙන්දෙකු සම්බන්ධයෙන් හෝ එම ද්‍රව්‍ය භාවිතා කිරීමට අදහස් කරන අවසන් භාවිතකරුවකු සම්බන්ධයෙන් වන විට ඔහු විසින් අලුතෙන් ද්‍රව්‍ය වෙළඳාම් කිරීමට හෝ භාවිතා කිරීමට, මාසයකට නොඅඩු කාලසීමාවකට පෙරාතුව මේ නියෝගවල "අ" උපලේඛණයේ දක්වා ඇති පිළිවෙලින් 7 වන සහ 10 වන ආකෘතිවලට අනුව ලියාපදිංචිය සංශෝධනය කිරීම සඳහා ඉල්ලුම්පත්‍රයක් අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(ආ) ලියාපදිංචිය සංශෝධනය කිරීම සඳහා වන සෑම ඉල්ලුම්පත්‍රයක්ම මේ නියෝගවල "ආ" උපලේඛණයේ සඳහන් කර ඇති ගාස්තුවලින් ත්‍ර

(ඇ) අදාල ගාස්තු සමඟ සංශෝධනය සඳහා ඉල්ලුම්පත්‍රයක් ලැබීමෙන් පසුව අධිකාරිය විසින්, ඒ ඉල්ලුම්පත්‍රයේ සපයා ඇති තොරතුරුවල නිරවද්‍යතාවය පිළිබඳ නිසැකව දැනගත යුතු අතර ඒ ඉල්ලුම්පත්‍රය ලැබුන දින සිට සති දෙකක් ඇතුලත ලියාපදිංචිය සංශෝධනය කළ යුතුය.

28. (අ) සෑම ලියාපදිංචි වෙළෙන්දෙකු සහ අවසන් භාවිතාකරුවකු විසින්ම ඔවුන්ගේ ලියාපදිංචිය වාර්ෂිකව අලුත් කරවා ගත යුතු අතර ඔහු විසින් ඒ ලියාපදිංචිය ඉකුත්වන දිනට මසකට පෙරාතුව, නියෝගවල "අ" උපලේඛණයේ දක්වා ඇති පිළිවෙලින් 8 වන සහ 11 වන ආකෘතිවලට අනුව තත්කාර්යය සඳහා වූ ඉල්ලුම්පත්‍රයක් අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(ආ) ලියාපදිංචිය අලුත් කිරීම සඳහා වන සෑම ඉල්ලුම්පත්‍රයක්ම මේ නියෝගවල "ආ" උපලේඛණයේ සඳහන් කර ඇති අදාල ගාස්තුවලින් සමන්විත විය යුතුය.

(ඇ) අදාල ගාස්තු සමඟ අලුත් කිරීම සඳහා ඉල්ලුම්පත්‍රයක් ලැබුනු පසුව අධිකාරිය විසින් ඒ ඉල්ලුම්පත්‍රයේ සපයා ඇති තොරතුරුවල නිරවද්‍යතාවය පිළිබඳ නිසැකව දැනගත යුතු අතර ඉල්ලුම්පත්‍රය ලැබුන දින සිට සති දෙකක කාල සීමාවක් තුල වසර එකක ඉදිරි කාලසීමාවක් සඳහා ලියාපදිංචිය අලුත් කරනු ලැබිය යුතුය.

29. වෙළෙන්දෙකු හෝ අවසන් භාවිතාකරන්නෙකු විසින් -

(අ) පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ ලියාපදිංචි සහතිකය නිකුත් කරන ලද්දේ යම් කොන්දේසිවලට යටත්වද, එකී යම් කොන්දේසියක් උල්ලංඝණය කර ඇති විටක හෝ අධිකාරිය විසින් නිකුත් කරනු ලැබූ යම් විධානයකට අනුකූල වී නොමැති අවස්ථාවකදී හෝ

(ආ) අධිකාරිය වෙත ඉදිරිපත් කළ යම් තොරතුරක් අසත්‍ය හෝ සාවද්‍ය වන අවස්ථාවක හෝ අදාළ යම් දත්ත සඟවා ඇති අවස්ථාවක

අධිකාරිය විසින් ලියාපදිංචිය අවලංගු කරනු හැකිය.

එසේ වුවද, ඒ අවලංගු කිරීමට පෙරාතුව අධිකාරිය විසින් ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කල තැනැත්තාට කරුණු දැක්වීමට අවස්ථාවක් ලබාදිය යුතුය.

30. 29 වන නියෝගය යටතේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබූ සෑම වෙළෙන්දෙකුම හෝ අවසන් භාවිතාකරුවකු විසින්ම ඒ ලියාපදිංචිය අවලංගු කිරීමේ දින සිට පිළිවෙලින් වසර එකක් සහ වසර දෙකක් ඉකුත්වීමෙන් පසුව පමණක් ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කරනු ලැබිය යුතුය.

31. පනතේ පළමුවන උපලේඛණයේ I වන සහ II වන වගුව තුල නිශ්චිතව සඳහන් කර ඇති යම් ද්‍රව්‍යයක් පිළිබඳව සෑම ලියාපදිංචි වෙළෙන්දෙකු විසින්ම පහත දැක්වෙන වාර්තා පවත්වාගෙන යායුතු අතර අධිකාරිය විසින් ඉල්ලා සිටින අවස්ථාවකදී අධිකාරිය වෙත එම වාර්තා ඉදිරිපත් කල යුතුය.

(අ) පනතේ පළමුවන උපලේඛණයේ I වන වගුව සහ II වන වගුව තුල නිශ්චිතව දක්වා ඇති ඉහත කී ද්‍රව්‍ය මිළට ගත් හෝ ලබාගත් තැනැත්තන්ගේ හෝ භාවිතාකරුවන්ගේ නම සහ ලිපිනය,

(ආ) ඉහත කී ද්‍රව්‍යයන්ට අදාළව කරගෙන යන්නාවූ ක්‍රියාකාරකම්,

(ඇ) ක්‍රියාකාරකම් කරගෙන යන්නාවූ ස්ථානවලට අදාළ තොරතුරු,

(ඈ) එකී ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය කරන ද්‍රව්‍යවල ප්‍රමාණය

32. ලියාපදිංචි අවසන් භාවිතා කරන්නෙකුට හැර, මේ පනතේ පළමුවන උපලේඛණයේ I වන වගුවෙහි සහ II වන වගුවේ නිශ්චිතව සඳහන් කර ඇති කිසිදු ද්‍රව්‍යයක් කිසිදු ලියාපදිංචි වෙළෙන්දෙකු විසින් කිසිම තැනැත්තෙකුට විකිණීම හෝ ලබාදීම නොකල යුතුයි.

33. ලියාපදිංචි වෙළෙන්දෙකු විසින් 31 වන නියෝගය උල්ලංඝණය කරන අවස්ථාවක දී අධිකාරිය විසින් මේ පනත යටතේ පනවා ඇති වෙනත් නෛතික ප්‍රතිඵලයන්ට අමතරව ඒ තැනැත්තාගේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබිය යුතුය.

එසේ වුවද, ඒ අවලංගු කිරීමට පෙරාතුව අධිකාරිය විසින් ඒ තැනැත්තාට කරුණු දැක්වීමට අවස්ථාවක් ලබාදිය යුතුය.

34. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ නියෝගවල -
"වෙළෙන්දා" යන්නට තොග සහ සිල්ලර වෙළෙන්දන් ඇතුලත් වේ.

## "අ" උපලේඛණය

1. 1 වන ආකෘතිය
2. 2 වන ආකෘතිය
3. 3 වන ආකෘතිය
4. 4 වන ආකෘතිය
5. 5 වන ආකෘතිය
6. 6 වන ආකෘතිය
7. 7 වන ආකෘතිය
8. 8 වන ආකෘතිය
9. 9 වන ආකෘතිය
10. 10 වන ආකෘතිය
11. 11 වන ආකෘතිය

## "ආ" උපලේඛණය

අ. ලේඛණගත ද්‍රව්‍ය සඳහා බලපත්‍ර ගාස්තුව රු. 5,000/-

ආ. බලපත්‍ර සංශෝධන ගාස්තුව රු. 2,000/-

ඇ. බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තුව රු. 4,500/-

ඈ. පරිශ්‍ර ලියාපදිංචි කිරීමේ ගාස්තුව රු. 5,000/-

ඉ. වෙළඳුන් ලියාපදිංචි කිරීමේ ගාස්තුව රු. 4,000/-

ඊ. වෙළඳුන් ලියාපදිංචි කිරීම සංශෝධනය කිරීමේ ගාස්තුව රු. 1,500/-

උ. වෙළෙන්දන් ලියාපදිංචි කිරීම අලුත් කිරීමේ ගාස්තුව රු. 3,500/-

ඌ. අවසන් භාවිත කරන්නන් ලියාපදිංචි කිරීමේ ගාස්තුව රු. 1,500/-

එ. අවසන් භාවිත කරන්නන් ලියාපදිංචි කිරීම සංශෝධනය කිරීමේ ගාස්තුව රු. 500/-

ඒ. අවසන් භාවිත කරන්නන්ගේ ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තුව රු. 1,000/-